ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1698/22 - 2011 මාර්තු 24 වැනි බ්‍රහස්පතින්දා - 2011.03.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV(අ) වැනි කොටස - පළාත් සභා

පළාත් සභා නිවේදන

බස්නාහිර පළාත් සභාව

බස්නාහිර පළාත් සභාවේ 2010 අංක 06 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති

බස්නාහිර පළාත් සභාවේ 2010 අංක 06 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 23 වැනි වගන්තිය යටතේ මා වෙත පවරනු ලැබ තිබෙන බලතල ප්‍රකාර, බස්නාහිර පළාත් සභාවේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදාහැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය හේවා මාතරගේ උපාලි කොඩිකාර වන මම, පහත සඳහන් රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට බලපැවැත්විය යුතුය.

හේවා මාතරගේ උපාලි කොඩිකාර,
බස්නාහිර පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු,
සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන,
ආහාර සැපයීම් හා බෙදාහැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

2011 මාර්තු මස 24 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ,
අංක 204 දරන ස්ථානයේ පිහිටි
බස්නාහිර පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු,
සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන,
ආහාර සැපයීම් හා බෙදාහැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය.

බස්නාහිර පළාත් සභාවේ 2010 අංක 06 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති

බස්නාහිර පළාතේ, 2010 අංක 06 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 23 වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදන ලද රීති.

1A - PG 001230— 550 (2011/03)

රීති

ලුහුඩු නාමය

1. මෙම රීති බස්නාහිර පළාත් සභාවේ 2010 අංක 06 දරන සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

දායකයෙකු වීමට සුදුසුකම්

2. 1998 අංක 3 දරන සමූපකාර සමිති ප්‍රඥප්තිය යටතේ බස්නාහිර පළාතේ ලියාපදිංචි කළ සමූපකාර සමිතියක හෝ සංගමයක හෝ සේවයේ නියුතු මෙහි මින්මතු "සේවකයා" යනුවෙන් හඳුන්වනු ලබන 1994 අංක 01 දරන බස්නාහිර පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියට අනුකූලව ස්ථිර පත්වීමක් ලද සේවකයෙකු, සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකයෙකු වශයෙන් බඳවා ගනු ලැබීමට හිමිකම් ලබන්නේ ය.

මනාපය පළ කිරීම හා අයැදුම් කිරීම

3. (1) (අ) සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතුව සිටි, යෝජනා ක්‍රමයට බඳවා ගනු ලැබීමට හිමිකම් ලැබූ තැනැත්තෙකු, තමා දායකයෙකු ලෙස විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීම සඳහා මෙම රීති මාලාවේ 24(1) ප්‍රකාශ පත්‍රය අනුව මනාපය පළකල යුතුය.

(ආ) සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීමට අපේක්ෂා කරන දැනට සේවයේ නියුතුව සිටින සේවකයෙකු, 24(2) උප වගන්තිය මගින් නියම කර ඇති විධිවිධානවලට අනුව අධ්‍යක්ෂවරයා විසින් සකස් කර ඇති ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කර මෙම රීති ක්‍රියාත්මක වන දින සිට එක් අවුරුදු කාලයක් තුළ අධ්‍යක්ෂවරයා වෙත යොමු කළ යුතුය.

(2) මෙම රීති මගින් ඇතුළත් කර ඇති කාරණාවලට අනුව මෙම රීති ක්‍රියාත්මක වූ දිනෙන් පසු ස්ථිර සේවයට බැඳෙන සේවකයෙකු, තමා සේවයට බැඳුනු දින සිට දින 90ක කාලයක් ඇතුළත දී මෙම රීති මගින් නියම කර ඇති ආකාරයට අනුව සකස් කර ඇති ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කර අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

දායකයකු ලෙස සැලකීම

4 (1) බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට ඉල්ලුම්කරුගේ සුදුසුකම් පිළිබඳව සපයන ලද තොරතුරුවල සත්‍යතාවය හා නිවැරදිභාවය තහවුරු කර ගැනීමෙන් පසු අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලුම් පත්‍රය අනුමත කිරීමත් සමගම එම ඉල්ලුම්කරු යෝජනා ක්‍රමයේ දායකයකු වන්නේ ය.

අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම

(2) පහත දැක්වෙන එක් කරුණක් හෝ කරුණු කීපයක් මත ඉල්ලුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

(අ) මෙම රීති මාලාවේ 2 වැනි වගන්තියේ සඳහන් ආකාරයට සේවකයෙකු නොවීම ;

(ආ) වයස අවු. 18ට අඩු සහ වයස අවු. 60 ඉක්ම වූ සේවකයෙකු වීම ;

(ඇ) ඉල්ලුම් පත්‍රය අසම්පූර්ණ වීම ;

(ඈ) අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර තිබීම ;

(ඉ) ඉල්ලුම්පත්‍ර මෙම රීති මාලාවේ නියම කර ඇති කාලසීමාව තුළ ඉදිරිපත් කර නොතිබීම.

(3) යම් ඉල්ලුම්පත්‍රයක් අධ්‍යක්ෂවරයා විසින් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක, එම තීරණය ලැබී දින 60ක් ඇතුළත පාලක මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. ඉල්ලීම ලැබී දින 30ක් ඇතුළත පාලක මණ්ඩලයේ තීරණය ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතුය.

දායක මුදල

5. (1) සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳෙන දායකයෙකු තම මාසික මූලික වැටුපෙන් සියයට පහක් (5%) මාසික දායකය වශයෙන් සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු අතර, එම දායක මුදල තම මාසික වැටුපෙන් අයකර සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල වෙත යැවීම සඳහා සේවායෝජක සමිතියට හෝ සංගමයට ලිඛිතව බලය පැවරිය යුතුය.

සමිති දායකය

(2) සේවායෝජක සමිතිය හෝ සංගමය හෝ විසින් සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳෙන එක් එක් දායකයෙකු වෙනුවෙන් එකී දායකයාගේ මාසික මූලික වැටුපෙන් සියයට දෙකයි දශම පහක (2.5%ක) මුදලක් මාසිකව සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල වෙත ගෙවිය යුතුය.

(3) ඉහත 5(1) සහ 5(2) උප වගන්ති අනුව නියම කර ඇති ආකාරයට සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායකයාගෙන් අයකරන දායක මුදල් හා සේවායෝජක සමූපකාර සමිතිය හෝ සංගමය හෝ විසින් ගෙවිය යුතු දායක මුදල් ඊළඟ මස 15 වැනි දින හෝ ඊට පෙර සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. දායක මුදල් ප්‍රේෂණය

(4) ඉහත 5(3) හි නියම කර ඇති පරිදි නියමිත දිනට දායක මුදල් සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල වෙත යැවීම පැහැර හැර ඇති විටෙක, අදාළ සමූපකාර සමිතිය හෝ සංගමය හෝ පහත සඳහන් පරිදි අධිභාරයකට යටත්විය යුතුය. එම අධිභාරය අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන පහත සඳහන් ආකාරයට සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතුය. දඩ මුදල් අය කිරීම

ප්‍රමාදය දින 15 නොඉක්ම වූ විට	-	5%
ප්‍රමාදය දින 16ත් මාස 01 අතර වන විට	-	10%
ප්‍රමාදය මාස 1ත් මාස 03 අතර වන විට	-	15%
ප්‍රමාදය මාස තුනට වැඩි	-	20%

(5) මෙම විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට සමූපකාර සමිති/සංගම් සතුව පවතින සේවක ජීවන ප්‍රතිලාභ නමින් ඇති අරමුදලේ ශේෂය විශ්‍රාම වැටුප් අරමුදලට ප්‍රේෂණය කළ යුතුය.

6. (1) මෙම යෝජනා ක්‍රමයේ දායකයෙකු, විශ්‍රාම වැටුප් හිමිකම් ලැබීම සඳහා අවම වශයෙන් මාස හැටක (60) දායක මුදල් අනිවාර්යයෙන්ම අරමුදල වෙත ගෙවා සම්පූර්ණ කර තිබිය යුතුය. : අවම දායක මුදල හා විශ්‍රාම වැටුප් හිමිකම්

(අ) සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට වයස අවුරුදු 55 ඉක්ම වූ සේවකයෙකු සම්බන්ධයෙන් වූ විට දී, එම තැනැත්තා වයස අවුරුදු 60 ඉක්මවන විට මෙම රීතිවල 5(1) සහ 5(2) වගන්තිවලින් දැක්වෙන දායක මුදල් එකතුව අවම වශයෙන් වාරික 60කින් දායකයා විසින් ගෙවා නිම කළ යුතුය.

තවද මෙම හිඟ වාරිකය අවුරුද්දක් තුළ එක්වරම හෝ කොටස් වශයෙන් ද ගෙවිය හැකිය.

(ආ) ඉහත 6(1)(අ) යටතේ දායක මුදල් ගෙවා නිමකරන දායකයෙකුට විශ්‍රාම වැටුප සඳහා හිමිකම් ලැබෙන්නේ මෙම රීතිවල දෙවන උපලේඛනයේ සඳහන් වන ආකාරයටය.

(2) මෙම යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී ඊළඟ උපන් දිනයට වයස අවුරුදු 55ට නොවැඩි දායකයෙකු සම්බන්ධයෙන් වූ විට දී, මෙම රීතිවල පළමු උපලේඛනයේ සඳහන් ආකාරයට අවම වාරික සංඛ්‍යාවක් දායක මුදල් ගෙවිය යුතුය. එම උපලේඛනයේ iv වැනි තීරයේ සඳහන් ආකාරයට විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇත්තේ ය.

7. වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ලබා ඇති දායකයෙකු සම්බන්ධයෙන්, වෛද්‍ය හේතූන් මත විශ්‍රාම යාමේදී ගෙවනු ලබන ප්‍රතිලාභ

(1) ඔහු විශ්‍රාම ලැබූ දිනට වයස අවුරුදු 50 ඉක්මවූ දායකයෙකු, අවම වශයෙන් දායක මුදල් වාරික 60ක් ගෙවා ඇති විට, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇත.

(2) දායකයා විශ්‍රාම ලැබූ දිනට වයස අවුරුදු 50 නොඉක්මවූ දායකයෙකු අවම වශයෙන් දායක මුදල් වාරික 120ක් ගෙවා ඇති විටෙක, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තේ ය.

(3) එසේ වුවද දායකයාගේ ඉල්ලීම මත, එතෙක් අය වූ දායක මුදල් හා ඊට අදාළ පොලිය, එකවර ගෙවනු ලබන සමුච්චිත මුදලක් ලෙස ලැබීමට දායකයෙකුට හිමිකම් ඇත්තේ ය.

(4) දායකයෙකුට හිමිකම් ඇත්තේ ඉහත 7(1) හෝ 7(2) යටතේ විශ්‍රාම වැටුපක් හෝ 7(3)යටතේ සමුච්චිත මුදලක් හෝ යන දෙකෙන් එකක් ප්‍රතිලාභයක් පමණි.

(5) වයස අවුරුදු 50 ඉක්ම වූ සේවකයෙක් සම්බන්ධයෙන් වූ අවස්ථාවක, අවම දායක මුදල වාරික 60ක් නොගෙවා ඇති විටෙක, අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ලද කාලයක් තුළ දී හිඟ දායක වාරික මුදල් එකවර හෝ වාර කීපයකින් හෝ ගෙවා නිම කරන ලද දායකයෙකුට, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විටෙක විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තේ ය. හිඟ වාර මුදල් ගෙවීම සඳහා නියම කරන ලද කාලය, දායකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනයේ හෝ ගෙවීම නියම කරනු ලබන දිනයේ සිට එක් අවුරුදු කාල සීමාවක් යන දෙකෙන් පළමුව එළඹෙන දිනය විය යුතුය.

(6) වයස අවුරුදු 50ට වඩා අඩුවන සේවකයෙකු සම්බන්ධයෙන් වූ අවස්ථාවක, අවම දායක වාරික මුදල් වාරික 120ක් නොගෙවා ඇති විටෙක, දායකයාගෙන් එතෙක් අය වූ දායක මුදල් හා ඊට අදාළ පොලිය එකවර ගෙවනු ලබන සමුච්චිත මුදලක් ලෙස ලැබීමට එවැනි දායකයකුට හිමිකම් ඇත්තේ ය.

(7) ඉහත 7(5) යටතේ හිමිකම් නොපාන්නේ නම්, එවැනි දායකයෙකු සඳහා ශුද්ධ දායක මුදල හා අදාළ පොළී මුදල් එකවර ගෙවනු ලබන සමුච්චිත මුදලක් ලෙස ලබා ගැනීමට හිමිකම් ඇත.

සේවයෙන් ඉල්ලා අස්වූ විට ගෙවනු ලබන ප්‍රතිලාභ

8. දායකයෙකු විශ්‍රාම වැටුප හිමි වීමට පෙරාතුව සමුපකාර සේවයෙන් ඉල්ලා අස්වන්නේ නම්, ඔහු යෝජනා ක්‍රමයෙන් ඉවත් වූ ලෙස සැළකිය යුතු අතර, එවැනි තැනැත්තෙකු අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව කරන ඉල්ලීමක් මත, දායකයාගේ ශුද්ධ දායක මුදල සහ ඊට අදාල වන පොළිය, සමුච්චිත මුදලක් ලෙස ලැබීමට එකී දායකයාට හිමිකම් ඇත්තේ ය.

වැටුප් රහිත නිවාඩු ලබා ඇති අවස්ථාවක විශ්‍රාම වැටුප් කාලය ගණනය කිරීම

9. යම් දායකයෙකු විධිමත්ව විදේශ රැකියාවක් සඳහා වැටුප් රහිත නිවාඩු ලබා සිටින අවස්ථාවක දී, එම වැටුප් රහිත සේවා කාලය විශ්‍රාම වැටුප ගණනය කිරීම සඳහා ගණන් නොගත යුතු අතර එම කාලය සඳහා දායක මුදල් ද අය නොකළ යුතුය.

අවලංගු කළ සමිතියක හෝ සංගමයක හෝ දායකයෙකුට ප්‍රතිලාභ ගෙවීම

10. යම් සමුපකාර සමිතියක් හෝ සංගමයක් හෝ නීතිය අනුව ඈවර කිරීම සඳහා ලියාපදිංචිය අවලංගු කර ඇති විටෙක, සමිතිය හෝ සංගමය හෝ ලියාපදිංචිය අවලංගු කරන දිනය දක්වා දායක මුදල් ගෙවා ඇති අවස්ථාවක

(1) සමිතියේ හෝ සංගමයේ ලියාපදිංචිය අවලංගු කරන ලද දිනට වයස අවුරුදු 50 ඉක්ම වූ දායකයෙකු අවම වශයෙන් දායක මුදල් වාරික 60ක් ගෙවා ඇති අවස්ථාවක, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තේ ය.

(2) සමිතියේ හෝ සංගමයේ ලියාපදිංචිය අවලංගු කරන ලද දිනට වයස අවුරුදු 50 නොඉක්මවූ දායකයෙකු, අවම වශයෙන් දායක මුදල් වාරික 120ක් ගෙවා ඇති අවස්ථාවක, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තේය.

(3) එසේ වුවද දායකයා ඉල්ලා සිටින්නේ නම්, එතෙක් අය වූ දායක මුල් හා ඊට අදාළ පොලිය එකවර ගෙවනු ලබන සමුච්චිත මුදලක් ලෙස ලැබීමට දායකයෙකුට හිමිකම් ඇත්තේ ය.

(4) දායකයෙකුට හිමිකම් ඇත්තේ, ඉහත 10(1) හෝ 10(2) යටතේ විශ්‍රාම වැටුපක් හෝ 10(3) යටතේ වන සමුච්චිත මුදලක් හෝ යන දෙකෙන් එක් ප්‍රතිලාභයකට පමණි.

(5) වයස අවුරුදු 50 ඉක්ම වූ සේවකයෙක් සම්බන්ධයෙන් වූ අවස්ථාවක, අවම දායක මුදල් වාරික 60ක් වත් නොගෙවා ඇති විටෙක, අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ලද එක් වර්ෂයක කාලයක් තුළ 5(1) සහ 5(2) පරිදි හිඟ දායක මුදල් එකවර හෝ වාර කීපයකින් හෝ ගෙවා නිම කරන ලද දායකයෙකුට, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ අවස්ථාවක විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තේය. හිඟ දායක මුදල් ගෙවීම සඳහා නියම කරන ලද කාලය, දායකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනයේ දී හෝ ගෙවීම් නියම කරනු ලබන දිනයේ සිට එක් අවුරුදු කාල සීමාවක් යන දෙකෙන් පළමුව එළඹෙන දිනය විය යුතුය.

(6) වයස අවුරුදු 50ට වඩා අඩුවන සේවකයකු සම්බන්ධයෙන් වූ අවස්ථාවක අවම දායක වාරික මුදල් 120ක් නොගෙවා ඇති අවස්ථාවක, දායකයාගෙන් එතෙක් අය වූ දායක මුදල් හා ඊට අයත් පොළිය එකඟත්වය මත එකවර ගෙවනු ලබන සමුච්චිත මුදලක් ලෙස ලබා ගැනීමට හිමිකම් ඇත්තේ ය.

(7) ඉහත 10(5) යටතේ හිමිකම් නොපාන්නේ නම්, එවැනි දායකයෙකු සඳහා ශුද්ධ දායක මුදල හා අදාළ පොලී මුදල් එකවර ගෙවනු ලබන සමුච්චිත මුදලක් ලෙස ලබා ගැනීමට හිමිකම් ඇත්තේ ය.

11. (1) මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකයෙකු යම් අතිරේක දායක මුදලක් නොගෙවා මරණ පාරිතෝෂිකයට හිමිකම් ලබන්නේ ය. මරණ පාරිතෝෂිකයට හිමිකම් ලැබීම.

(2) මෙහි තුන්වන උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් සේවා කාලයක් ඇති දායකයෙකු වූ විට, II තීරයේ සඳහන් මරණ පාරිතෝෂිකය ලැබීමට පහත දැක්වෙන පරිදි දායකයාගේ යැපෙන්නන්ට හිමිකම් ලැබිය යුතු ය. මරණ පාරිතෝෂිකය ලැබීමට ඇති අය.

(3) මියගිය දායකයා විවාහකයෙකු වන අවස්ථාවක දී :

(අ) වැන්දඹු භාර්යාව/වැන්දඹු පුරුෂයා වෙත මරණ පාරිතෝෂිකයෙන් හරි අඩක් ද, රැකියා විරහිත අවිවාහක දරුවන් අතර සමසේ ඉතිරි හරි අඩ ද ගෙවිය යුතු ය.

(ආ) රැකියා විරහිත අවිවාහක දරුවන් නොමැති විටෙක දී මුළු මරණ පාරිතෝෂික මුදල වැන්දඹු භාර්යාව/වැන්දඹු පුරුෂයා වෙත ලැබීමට හිමිකම් ඇත්තේ ය.

(ඇ) දායකයාගේ වැන්දඹු භාර්යාව/වැන්දඹු පුරුෂයා ජීවත්ව නොසිටින විටෙක, මුළු මරණ පාරිතෝෂිත මුදල අවිවාහක දරුවන් අතර සමසේ බෙදිය යුතු ය.

(4) මියගිය දායකයා අවිවාහකයෙකු වන අවස්ථාවක දී :

(අ) දායකයාගේ මව සහ පියා අතර එකී මරණ පාරිතෝෂික මුදල සමව බෙදිය යුතුය. මව සහ පියා යන අයගෙන් එක් අයෙකු පමණක් ජීවත්ව සිටී නම්, එම තැනැත්තා වෙත මුළු පාරිතෝෂිත මුදල ලබාදිය යුතු ය.

(ආ) මව හා පියා දෙදෙනාම ජීවත්ව නොසිටින අවස්ථාවක දී, අවිවාහක සොයුරු සොයුරියන් අතර එකී පාරිතෝෂිත මුදල සමසේ බෙදිය යුතු ය.

(5) මියගිය දායකයාගේ මරණ පාරිතෝෂිකය බාල වයස්කරුවන්ට හිමිවන අවස්ථාවක දී, අධ්‍යක්ෂවරයා ඔවුන් නමින් ග්‍රාමීය බැංකුවේ හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ හෝ මහජන බැංකුවේ හෝ ලංකා බැංකුවේ හෝ බාල වයස්කාර ගිණුමක තැන්පත් කර, ඒ බව අදාළ භාරකරුවන් වෙත දැනුම් දියයුතු අතර, ඒවා ලේඛන ගතකර ගිණුම් පොත්/සහතික ආරක්ෂිතව තබාගත යුතුය. බාල වයස්කරුවන්ගේ වයස සම්පූර්ණ වී ඉල්ලුම් කළ අවස්ථාවක ඒවා නිදහස් කර දීමට කටයුතු කළ යුතු ය.

(6) යැපෙන්නන් සම්බන්ධයෙන් ගැටලු පැන නගින අවස්ථාවක දී, අධ්‍යක්ෂවරයා විසින් පාලක මණ්ඩලයේ එකඟත්වය මත තීරණය කරනු ලබන යැපෙන්නන්ට ගෙවීම් කළ යුතු ය.

12. මෙම රීතිවල 11 වගන්තියේ සඳහන් පරිදි මරණ පාරිතෝෂිකය ලැබීමට හිමිකම් ලබන තැනැත්තා, මරණ පාරිතෝෂිකය ලැබීමට හිමිකම් ලබන අවස්ථාවක දී තමාට එම හිමිකම් ලැබීමට එම දායකයාගේ මරණය සිදුවීමෙන් දින 90ක් තුළ දී අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලීමක් කළ යුතු ය. දින 90ක් තුළ මරණය පිළිබඳ දැනුම් දිය යුතු බව.

13. විශ්‍රාම වැටුප ලැබීමට පෙර දායකයා මරණයට පත් වූ අවස්ථාවක අධ්‍යක්ෂවරයාගේ තීරණය මත දායකයාගේ ශුද්ධ දායක මුදල හා අදාළ වන පොළිය ද, සමුච්චිත මුදලක් ලෙස II වැනි රීතියේ සඳහන් ආකාරයට දායකයාගේ යැපෙන්නන්ට ගෙවනු ලැබිය යුතු ය. මියගිය දායකයාගේ දායක මුදල.

සහතිකය නැවත වලංගු කරවා ගැනීම සඳහා මාස 03ක් ඇතුළත ඉල්ලීමක් කළ යුතු බව.

14. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 12(2) උප වගන්තිය යටතේ යම් කිසි දායකයෙකුට ප්‍රතිලාභ අහිමි වන්නේ නම්, ඒ බව අධ්‍යක්ෂවරයා විසින් දායකයා වෙත ලිඛිතව දැනුම් දුන් දින සිට, තම සහතිකය වලංගු කරවා ගැනීම සඳහා මාස 03ක් ඇතුළත පාලක මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය.

සේවයෙන් පහ කරනු ලැබූ හෝ සේවය අතහැර ගිය දායකයෙකු සම්බන්ධයෙන් වූ විට.

15. (1) යම්කිසි දායකයෙකු සමුපකාර සේවයෙන් පහ කරනු ලැබුවහොත් හෝ තනතුර අතහැර ගිය අයෙකු සේ සළකනු ලැබුවහොත් හෝ ඔහු, යෝජනා ක්‍රමයෙන් ඉවත් වූ ලෙස සැළකිය යුතු අතර, එවැනි අයෙකු අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව කරන ඉල්ලීමක් මත, අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන දායකයාගේ ශුද්ධ දායක මුදල පමණක් ලැබීමට එකී දායකයාට හිමිකම් ඇත්තේ ය.

නීත්‍යානුකූල පරීක්ෂණයකින් වරදකරුවකු වූ දායකයෙකු සම්බන්ධයෙන් වූ විට.

(2) එසේ වුවද, සමිතියට හෝ සංගමයට හෝ අලාභයක් සිදුකර ඇති බවට නීත්‍යානුකූල පරීක්ෂණයකින් හෝ අධිකරණ ක්‍රියාවලියකින් සනාථ වී ඇති අවස්ථාවක, ශුද්ධ දායක මුදල දායකයෙකුට ගෙවිය යුත්තේ, සමිතියේ අලාභය සම්පූර්ණයෙන් ම ප්‍රතිපූර්ණය කර ඇත්නම් හෝ නීත්‍යානුකූල පරීක්ෂණය හා/හෝ අධිකරණ ක්‍රියාවලිය අවසන් වී සමිතියට අලාභයක් සිදු වී නොමැති බවට සනාථ වුවහොත් පමණි.

සමිතියට අලාභයක් සිදුකර ඇති අවස්ථාවක දී සමුච්චිත මුදල නොගෙවිය යුතුය.

(3) මෙම රීති මාලාව යටතේ සමුච්චිත මුදලක් ලැබීමට හිමිකම් ලබන දායකයෙකු විසින්, සමිතියට හෝ සංගමයට හෝ අලාභයක් සිදුකර ඇති බවට නීත්‍යානුකූල පරීක්ෂණයකින් හෝ අධිකරණ ක්‍රියාවලියකින් සනාථ වී ඇති අවස්ථාවක සමුච්චිත මුදල දායකයාට ගෙවිය යුත්තේ, සමිතියේ අලාභය සම්පූර්ණයෙන් ම ප්‍රතිපූර්ණය කර ඇත්නම් හෝ නීත්‍යානුකූල පරීක්ෂණය හෝ අධිකරණය ක්‍රියාවලිය අවසන් වී සමිතියට අලාභයක් සිදුවී නොමැති බවට සනාථ වුවහොත් පමණි.

නැවත සේවයේ පිහිටුවනු ලැබූ දායකයෙකු සම්බන්ධයෙන් වූ විට.

16. (1) යම්කිසි දායකයෙකු සමුපකාර සේවයේ වැඩ තහනමකට ලක්ව සිට නැවත සේවයේ පිහිටුවනු ලැබුවහොත්, අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන කාලසීමාවක් තුළ දී හිඟ දායක මුදල් ගෙවා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක විය යුතු ය.

(2) 16 (1) උප වගන්තිය අනුව දායක මුදල් ගෙවා අවසන් කළ යුතු දිනය අධ්‍යක්ෂවරයා විසින් දායකයා වෙත දැන්විය යුතු අතර, එම දිනට පෙර හිඟ දායක මුදල් ගෙවීමට අපොහොසත් වන දායකයෙකුගේ විශ්‍රාම වැටුප් සහතිකය අවලංගු වූවා සේ සැළකිය යුතු ය.

17. (1) සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 11(1) උප වගන්තිය යටතේ යම් දායකයෙකු වෙත නියමිත ප්‍රතිලාභ අහිමි වූ අවස්ථාවක, ඒ බව අධ්‍යක්ෂවරයා විසින් දායකයා වෙත දැන්විය යුතුය.

(2) ඉහත 17(1) උප වගන්තිය යටතේ සහතිකය අහිමි වූ යම්කිසි දායකයෙකු තව දුරටත් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ රැඳී සිටීමට අපේක්ෂා කරනු ලබන්නේ නම්, දායකයා විසින් සමිතියට හෝ සංගමයට සිදුකර ඇති අලාභය සම්පූර්ණයෙන් ම ගෙවා අවසන් කර අධ්‍යක්ෂවරයා වෙත සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වීමට ලිඛිතව ඉල්ලීමක් කළ යුතුය. එසේ කරනු ලබන ඉල්ලීම දැන්වීමේ දින සිට මාස 03ක් ඇතුළත 17(1) උප වගන්තිය අනුව අධ්‍යක්ෂවරයා වෙත එවිය යුතු ය.

(3) (අ) 17(2) උප වගන්තියේ ඉල්ලීම පරිදි යෝජනා ක්‍රමයේ රැඳී සිටීමට අධ්‍යක්ෂවරයා අවසර ලබා දුන් අවස්ථාවක ඔහු විසින් නියම කරනු ලබන කාල සීමාවක් ඇතුළත දී හිඟ දායක මුදල් ගෙවා නිමකළ යුතු ය.

(ආ) (අ) ඡේදය අනුව දායක මුදල් ගෙවා අවසන් කළ යුතු දිනය අධ්‍යක්ෂවරයා විසින් දායකයා වෙත දැන්විය යුතු අතර, එම දිනට පෙර හිඟ දායක මුදල් ගෙවීමට අපොහොසත් වන දායකයෙකුගේ සහතිකය අවලංගු වූවා සේ සැලකිය යුතුය. අධ්‍යක්ෂවරයා විසින් හිඟ දායක මුදල් ගෙවීමට නියම කරනු කාලය මාස 06ක් නොඉක්ම විය යුතු ය.

18. (1) වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසු, කිසියම් දායකයෙකු වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට ප්‍රථම විධිමත්ව සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ අවස්ථාවක එම විශ්‍රාම ගන්නා අවස්ථාව වන විට ගෙවා සම්පූර්ණ කර ඇති දායක මුදල් වාරික සංඛ්‍යාව පදනම් කරගෙන, මෙම රීතිවල පළවන උපලේඛනයේ II වැනි තීරුවේ දැක්වෙන විශ්‍රාම වැටුපක් ලැබීමට එම දායකයාට වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට හිමිකම් ලැබෙන්නේ ය. *(වයස අවුරුදු 60ට පෙර විශ්‍රාම ගත් දායකයෙකු සම්බන්ධයෙන් වූ විට.)*

(2) එසේ වුව ද, එවැනි දායකයෙකු විසින් අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව කරන ඉල්ලීමක් මත, අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන දායකයාගේ ශුද්ධ දායක මුදල සහ ඊට අදාළවන පොළිය එකවර ගෙවන සමුච්චිත මුදලක් ලෙස ලැබීමට එකී දායකයාට හිමිකම් ඇත්තේ ය.

(3) එවැනි දායකයෙකුට හිමිකම් ඇත්තේ 18(1) උප වගන්තිය යටතේ විශ්‍රාම පැටුපක් හෝ 18(2) උප වගන්තිය යටතේ සමුච්චිත මුදලක් යන දෙකෙන් එක් ප්‍රතිලාභයක් සඳහා පමණි.

19. මෙම රීති මාලවේ 7, 9 සහ 18 යන වගන්ති ප්‍රකාරව විශ්‍රාම වැටුප් හිමිකම් ලබන දායකයෙකු වයස අවුරුදු 60 සම්පූර්ණවීමට පෙර මිය ගියහොත්, මෙහි තුන්වන උපලේඛනය අනුව ගණනය කරන ලද මරණ පාරිතෝෂිකය හා 13 වැනි රීතියේ සඳහන් වන ගොනු මුදල මෙම රීති මාලාවේ 11 වැනි වගන්තියේ ප්‍රකාරව හිමිකම් ලබන පාර්ශවයන් වෙත ගෙවනු ලැබිය යුතු ය. *(වයස අවුරුදු 60ට පෙර සේවයෙන් ඉවත් වී විශ්‍රාම වැටුප් ලැබීමට පෙර මියගිය දායකයකු සම්බන්ධයෙන් වූ අවස්ථාවක.)*

20. මෙම රීති මාලාව යටතේ, සමුච්චිත මුදලක් හෝ ශුද්ධ දායක මුදලක් හෝ එකවර ගෙවනු ලබන මුදලක් ලෙස ලැබීමට හිමිකම් ලබන යම් දායකයෙකු විසින්, තම සේවා යෝජක සමිතිය හෝ සංගමය හෝ සමඟ නීත්‍යානුකූල ගිවිසුමක් මත ගිවිසගත් යම් මුදලක් එකී සමිතියට හෝ සංගමයට ගෙවීමට ඇති අවස්ථාවක දී සමිතිය හෝ සංගමය හෝ විසින්, දායකයාගේ එකඟත්වය සමග අධ්‍යක්ෂවරයාට කරන ඉල්ලීමක් සලකා බැලීමෙන් අනතුරුව, එසේ ගිවිසගත් මුළු මුදල හෝ ඉන් කොටසක් පියවීම සඳහා හෝ දායකයාගේ සමුච්චිත මුදල හෝ ශුද්ධ දායක මුදල සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ අධ්‍යක්ෂවරයාගෙන් ඉල්ලීම් කරනු ලබන සමිතියට හෝ සංගමයට ගෙවිය හැකිය. *(ගොනු මුදලෙන් හෝ ශුද්ධ දායක මුදලෙන් ගිවිසුම් ගත මුදල් පියවීම.)*

21. (1) මෙම රීති මාලාවේ දක්වා ඇති ආකාරයට හැර, යම්කිස් දායකයෙකු සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප/දීමනා/පාරිතෝෂිකය ගෙවීම පිළිබඳ ගැටලුවක් මතු වූ අස්ථාවක දී, අධ්‍යක්ෂවරයා විසින් පාලක මණ්ඩලයේ එකඟත්වය මත තීරණයක් ගත යුතු ය. *(ගැටලු පැන නඟින අවස්ථාවක අධ්‍යක්ෂවරයා පාලක මණ්ඩලයේ එකඟත්වය මත තීරණ ගැනීම.)*

(2) අධ්‍යක්ෂවරයා විසින් ගනු ලබන තීරණය පිළිබඳ අතෘප්තියට පත් දායකයෙකුට තීරණයේ දින සිට දින 60ක් ඇතුළත අභියාචනා මණ්ඩලය වෙත අභියාචනා කළ හැකිය. *(අභියාචනය කිරීම)*

(3) අභියාචනා මණ්ඩල විසින් 21(2) උප වගන්තිය යටතේ එකී මණ්ඩලයට ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතුය :-

(අ) අභියාචනා මණ්ඩලය 21(2) උප වගන්තිය යටතේ යොමු කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් එකී අභියාචනා පිළිබඳ තීරණය දිනය 90ක් තුළ අභියාචක වෙත ලිඛිතව දැන්විය යුතුය. එම අභියාචනා මණ්ඩලයේ තීරණය දන්වා යැවීමේ පිටපතක් අධ්‍යක්ෂ වෙත ද යොමු කළ යුතු ය.

(ආ) අභියාචනා මණ්ඩලයේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

(ඇ) අභියාචනා මණ්ඩලයේ සභාපතිගේ නියමය පරිදි, අභියාචනා මණ්ඩලයට කැඳවීම අභියාචනා මණ්ඩලයේ ලේකම් විසින් කළ යුතු ය.

(ඈ) අභියාචනා මණ්ඩලයේ ලේකම් අභියාචනා මණ්ඩලයේ රැස්වීම් කැඳවීම, රැස්වීම් පිළිබඳ වාර්තා තබා ගැනීම, තීරණ දැනුම් දීම සහ ඊට අදාළ ගොනු තබා ගැනීම සිදු කළ යුතු ය. *(ලේකම්වරයාගේ කාර්ය භාරය.)*

(ඉ) අභියාචනා මණ්ඩලයේ සාමාජිකයින්ට සහ අභියාචනා මණ්ඩලයේ ලේකම්ගේ රැස්වීම් දීමනා සහ ගමන් ගාස්තු ගෙවීම පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යටත් ව විෂයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන මුදලක් විය යුතු ය.

(ඊ) අභියාචනා මණ්ඩලයේ රැස්වීම්වලදී සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 15(7) උප වගන්තියට අනුව සණ පූර්ණය පවතින අවස්ථාවක සමාන ඡන්ද ලැබුනු විටක අදාළ කාරණය සම්බන්ධයෙන් පූර්ණ සාමාජිකත්වය විසින් තීරණය කළ යුතුය.

(උ) අභියාචනා විභාගයක දී යම් සාක්ෂියක් හෝ තොරතුරක් අවශ්‍යවන අවස්ථාවක දී අධ්‍යක්ෂවරයා හෝ දෙපාර්තමේන්තු නිළධාරිය හෝ සමිතියක් හෝ සංගමයක් එහි නිලධාරීන් හෝ තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය වන්නේ යැයි හැඟෙන ඕනෑම පුද්ගලයෙකු හෝ කැඳවීමට හෝ අදාළ තොරතුරු ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට අභියාචනා මණ්ඩලයට බලය ඇත්තේ ය.

දැනට විශ්‍රාම වැටුප ක්‍රියාත්මක වන සමිති හෝ සංගම් ක්‍රියා කළ යුතු ආකාරය

22. (1) සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දින සිට, බස්නාහිර පළාතේ, යම් සමූපකාර සමිතියක හෝ සංගමයක ක්‍රියාත්මක වන විශ්‍රාම පැටුප් ක්‍රමයක් ඇත්නම් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමත් සමගම එකී විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි වන්නේය.

(2) එසේ වුවද මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට ද යම් සමිතියක් හෝ සංගමයක් විශ්‍රාම වැටුප් ගෙවන ලද්දේ නම් එම දායකයන් සඳහා ද, මෙම විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පසුව විශ්‍රාම යන දායකයන් සඳහා ද, ගෙවිය යුතු විශ්‍රාම වැටුප් එකී සමිතිය හෝ සංගමය විසින් තවදුරටත් ගෙවිය යුතු වන්නේ ය.

(3) ගෙවනු ලබන විශ්‍රාම වැටුපේ වටිනාකම සඳහන් කර (2) උප වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ගෙවනු ලබන දායකයින් පිළිබඳ ලේඛනයක් සමූපකාර සමිතිය හෝ සංගමය විසින් අධ්‍යක්ෂවරයා වෙත ලබාදීම අනිවාර්ය වන්නේ ය.

(4) (2) උපවගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ගෙවීමට අවශ්‍ය මුදල් රඳවාගෙන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීමට පෙර සමිතිය හෝ සංගමය විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වූ දායකයින්ගේ අයකර ගත් දායක මුදල් සහ සමිති දායක මුදල් ද ඇතුලුව සමිතියේ හෝ සංගමයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළ සියළුම මුදල් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දින සිට දින 90ක් ඇතුළත විශ්‍රාම වැටුප් අරමුදලට ප්‍රේෂණය කළ යුතුය.

(5) (2) උප වගන්ති යටතේ විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් නැති විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ඇතුළත් වීමට හිමිකම් ලැබූ දායකයන්ගේ 5(1), 5(2) වගන්තිය යටතේ අයකර ගත් දායක මුදල් 5(3) වගන්තිය අනුව විශ්‍රාම වැටුප් අරමුදලට ප්‍රේෂණය කළ යුතුය.

පාලක මණ්ඩලයේ කර්යයන්

(23) පාලක මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල සියල්ල හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

(අ) මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම

(ආ) මෙම යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම, මෙහෙයවීම, හා ක්‍රියාවේ යෙදවීමට අදාළ කරුණු පිළිබඳව අධ්‍යක්ෂවරයාට උපදෙස් ලබාදීම.

(ඇ) මෙම යෝජනා ක්‍රමයේ කටයුතු සමාලෝචනය කිරීම.

(ඈ) මෙම රීති මාලවේ 7(3), 7(7), 8, 10(3), 10(6), 10(7), 18(2) යටතේ සඳහන් පොලී ප්‍රතිශත සඳහා මහ බැංකුවේ පොලී අනුපාතය සැළකිල්ලට ගෙන වාර්ෂික පොළී අනුපාතය ගණනය කිරීම.

ආකෘති පත්‍ර

24. සංකේතාංක ක්‍රමයක් භාවිතා කරමින්, සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 12(1) උප වගන්තියේ සඳහන් ආකාරයට දායකයා වෙත නිකුත් කරන විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රයට අමතරව යෝජනා ක්‍රමයේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය විධිමත් කිරීමට, පහත කරුණු සඳහා අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරමින් ආකෘති පත්‍ර පිළියෙල කර භාවිතා කළ යුතුය.

(1) මනාපය පළ කිරීමේ ප්‍රකාශ පත්‍රය

(2) යෝජනා ක්‍රමයට බැඳීමේ ඉල්ලුම් පත්‍රය

(3) දායක මුදල් වැටුපෙන් අය කිරීම සඳහා බලය පැවරීමේ ලිපිය ;

(4) මාසික දායක මුදල් අවකරණ ලේඛනය ;

(5) දඩ මුදල් අය කිරීමේ දැන්වීම ;

(6) මරණ පාරිතෝෂිත ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය ;

(7) සමුච්චිත මුදල හෝ ශුද්ධ දායක මුදල ආපසු ගැනීමේ ඉල්ලුම් පත්‍රය ;

(8) දායකත්වය ඒකාබද්ධ කිරීමේ ඉල්ලුම් පත්‍රය ;

(9) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දිනට සමුපකාර සමිති/සංගම් විසින් ක්‍රියාත්මක කරනු ලැබූ, විශ්‍රාම වැටුපට හිමිකම් ලැබූ නිලධාරීන්ගේ දත්ත තොරතුරු ඇතුළත් කරනු ලබන ආකෘති පත්‍ර ;

(10) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දිනට සමුපකාර සමිතියක හෝ සංගමයක විශ්‍රාම යන දායකයින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා වන ආකෘති පත්‍ර ;

(11) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දිනට සමුපකාර සමිතියක හෝ සංගමයක විශ්‍රාම වැටුපට බැඳී සිටින සක්‍රිය සේවයේ යෙදී සිටින සමුපකාර සේවකයින්ගේ දත්ත හා තොරතුරු ඇතුළත් ආකෘති පත්‍ර ;

(12) යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තවදුරටත් අවශ්‍ය වේ යැයි හැඟෙන ආකෘති පත්‍ර

සාමාජිකත්වය ඒකාබද්ධ කිරීම

25. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට හිමිකම් ලැබූ දායකයෙකු සිය සේවා යෝජක සමුපකාර සමිතිය හෝ සංගමය හෝ මගින් අයදුම් කොට වෙනත් සමුපකාර සමිතියක හෝ සංගමයක හෝ ස්ථිර සේවයට බැඳුනහොත්, එසේ බැඳුනු දින සිට දින 60ක් ඇතුළත, සංගමයට ඒ බවට සේවායෝජක සමුපකාර සමිතිය හෝ සංගමය මගින් ලිඛිතව අධ්‍යක්ෂවරයා විසින් හඳුන්වා දී ඇති ආකෘතියට අනුව සිය විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රය වලංගුව පවත්වා ගැනීම සඳහා දායකත්වය ඒකාබද්ධ කිරීමට අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලුම් කළ යුතුය.

යෝජනා ක්‍රමයේ පරිපාලන වියදම් සඳහා වෙන් කිරීම

26. (1) විශ්‍රාම වැටුප් අරමුදලට මාසිකව ලැබෙන දායක මුදලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල් වලින් සියයට පහක් (5%) පරිපාලන වියදම් සඳහා වෙන් කරනු ලැබේ.

(2) ඉහත (1) උපවගන්තියෙන් වෙන් කරන ලද මුදල ප්‍රමාණවත් නොවුනහොත්, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 20 වැනි වගන්තියේ දක්වා ඇති ආයතනයකින් විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව ණය පහසුකම් ලබාගත හැකි වන්නේ ය.

(3) ප්‍රාරම්භක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරා ගැනීමේ දී පරිත්‍යාග, ප්‍රදාන, වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබිය හැකි ඕනෑම මුදලක් මේ සඳහා යොදාගත හැකිය.

ගිණුම් තැබීම

27. ගිණුම්කරන මූලධර්ම, ප්‍රතිපත්ති හා ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් තැබීමට අධ්‍යක්ෂවරයා වග බලා ගත යුතුය.

වාර්ෂික වියදම් ඇස්තමේන්තු

28. (1) අධ්‍යක්ෂවරයා විසින් මෙම යෝජනා ක්‍රමයේ කර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කර, විෂයභාර අමත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය.

(2) වාර්ෂික ඇස්තමේන්තුගත සීමාවන් ප්‍රමාණවත් නොවන අවස්ථාවල දී ඒ සඳහා පරිපූරක ඇස්තමේන්තු සකසා විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුය.

ත්‍රෛමාසික වාර්තා

29. සෑම කාර්තුවක් අවසානයේ දී ත්‍රෛමාසික ලැබීම් හා ගෙවීම් පිළිබඳ වාර්තාව පිළියෙල කළ යුතු අතර, එම වාර්තාව කාර්තුව අවසාන වී දින 30ක් ඇතුළත විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

පහසුකම් හා සේවා

30. යෝජනා ක්‍රමය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍යවන පහසුකම් හා සේවා ලබා ගැනීමේ දී පළාත් මූල්‍ය රෙගුලාසි හා ප්‍රසම්පාදන කමිටු සීමා අනුව කටයුතු කිරීමටත්, අධ්‍යක්ෂවරයා සතු මූල්‍ය සීමා ඉක්මවා යන අවස්ථාවල දී විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

කාර්ය මණ්ඩලය හා රාජකාරි පැවරීම

31. ප්‍රඥප්තියේ 3(2) වගන්තියේ දැක්වෙන ආකාරයට, යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩල යෙන් ඉටු කරවා ගත යුතුයි. එසේ යොදවා ගන්නා කාර්ය මණ්ඩලයට අධ්‍යක්ෂවරයා විසින් රාජකාරී පැවරීම සහ බලය පැවරීම කළ යුතුය.

පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම

32. අධ්‍යක්ෂවරයාට අමතරව මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ගණකාධිකාරීවරයෙකු සහ පරිපාලන කටයුතු සඳහා දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස් තනතුරක් ඇති කළ යුතු වන්නේ ය. මීට අමතරව පළාත් රාජ්‍ය කළමනාකාර සේවයේ තනතුරු 10ක් ද, කාර්යාල කාර්ය සහායක තනතුරු 02ක් ද, ආරම්භයේ දී අවශ්‍ය වන්නේ ය.

33. මෙම රීතිවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

(අ) උපලේඛනය

බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

වගුව අංක 01

වයස අවුරුදු 18ත් 55ත් අතර වයසක දී යෝජනා ක්‍රමයට බැඳෙන සේවකයින් ගෙවිය යුතු වාරික මුදල හා හිමිවන විශ්‍රාම වැටුප්

I වැනි තීරය	*II වැනි තීරය*	*III වැනි තීරය*	*IV වැනි තීරය*
සේවය ස්ථිර කළ දින සිට ඊළඟ උපන් දිනයට වයස අවුරුදු	*ගෙවිය යුතු මාසික දායක මුදල් වාරිකය සඳහා මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය*	*ගෙවිය යුතු අවම වාරික සංඛ්‍යාව*	*වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේ ජීවිතාන්තය දක්වා හිමිවන විශ්‍රාම වැටුප, විශ්‍රාම යන මාසයේ ලැබූ ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය*
19	5	504	80
20	5	492	79
21	5	480	78
22	5	468	77
23	5	456	76
24	5	444	75
25	5	432	74
26	5	420	73
27	5	408	72
28	5	396	71
29	5	384	70
30	5	372	69
31	5	360	68
32	5	348	67
33	5	336	66

I වැනි තීරය	II වැනි තීරය	III වැනි තීරය	IV වැනි තීරය
සේවය ස්ථිර කළ දින සිට ඊළඟ උපන්දිනයට වයස අවුරුදු	ගෙවිය යුතු මාසික දායක මුදල් වාරිකය සඳහා මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය	ගෙවිය යුතු අවම වාරික සංඛ්‍යාව	වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේ ජීවිතාන්තය දක්වා හිමිවන විශ්‍රාම වැටුප, විශ්‍රාම යන මාසයේ ලැබූ ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය
34	5	324	65
35	5	312	64
36	5	300	63
37	5	288	62
38	5	276	61
39	5	264	60
40	5	252	59
41	5	240	58
42	5	228	57
43	5	216	56
44	5	204	55
45	5	192	54
46	5	180	53
47	5	168	52
48	5	156	51
49	5	144	50
50	5	132	49
51	5	120	48
52	5	108	47
53	5	96	46
54	5	84	45
55	5	72	44

වගුව අංක 02

අවුරුදු 55-60ත් අතර වයසකදී යෝජනා ක්‍රමයට බැඳෙන සේවකයින් ගෙවිය යුතු මුදල් සහ හිමිවන විශ්‍රාම වැටුප්

I වැනි තීරය	II වැනි තීරය	III වැනි තීරය	IV වැනි තීරය	V වැනි තීරය
සේවය ස්ථිර කළ දිනට සිට ඊළඟ උපන් දිනයට වයස අවුරුදු	ගෙවිය යුතු මාසික දායක මුදල් වාරිකය සඳහා මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය	ගෙවිය යුතු අවම වාරික සංඛ්‍යාව	වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේ ජීවිතාන්තය දක්වා හිමිවන විශ්‍රාම වැටුප, විශ්‍රාම යන මාසයේ ලැබූ ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය	විශ්‍රාම වැටුප හිමිවන අවස්ථාව
56 සිට 59	7.5	60	40	වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනය හෝ අවම දායක මුදල් වාරික 60 ගෙවා නිමා කළ දිනය යන දෙකෙන් පසුව එළඹෙන දින සිට
60	7.5	60	40	අවම දායක මුදල් වාරික 60 ගෙවා නිමකළ දින සිට එක් අවුරුදු කාලයක් සම්පූර්ණ වූ දින සිට

(ආ) උපලේඛනය

මරණයකදී ගෙවන මරණ පාරිතෝෂිකය

I වැනි තීරය	II වැනි තීරය
සේවය ස්ථිර කළ දින සිට සේවා කාලය	හිමිවන මරණ පාරිතෝෂිකය රුපියල්
අවු. 0ට වැඩි - 5ට නොවැඩි	10,000
අවු. 5ට වැඩි - 10ට නොවැඩි	15,000
අවු. 10ට වැඩි - 15ට නොවැඩි	20,000
අවු. 15ට වැඩි - 20ට නොවැඩි	25,000
අවු. 20ට වැඩි - 25ට නොවැඩි	30,000
අවු. 25ට වැඩි - 30ට නොවැඩි	35,000
අවු. 30ට වැඩි	40,000

04-293

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.